

# මහින්ද, මර්වින් හා ජවිපෙ

**ම**හින්ද රාජපක්ෂ ආණ්ඩුව දෙස තවමත් මිනිසුන් නෙත් දල්වා බලාගෙන සිටින්නේ පවතින යුද්ධය ගැන බලාපොරොත්තු තියාගෙනය. ඒ වගට දිය හැකි හොඳම උදාහරණය වන්නේ මෑතකදී කැබිතිගොල්ලෑවට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හේතු කොටගෙන පියෙක් තම නැසුනු දියණියගේ මළකඳ අසලදී කියූ වදන් වැලයි. ''මම ජනාධිපතිතුමාට කියන්නේ දිගටම මේ කරගෙන යන යුද්ධය කරගෙන ගිහිල්ලා අන්තිම එකාවත් නැතිකරල මේක ඉවරයක් කරලා දාන්න කියලයි" දකුණේ ජනතාවත් තවමත් ඉවසගෙන සිටින්නේ මේ




යුද්ධය නිසාය. ''බඩු මිල වැඩි වුණොත් කරන්න දෙයක් නෑ. අපිට තව ටිකක් ඉවසන්න වෙනවා. බඩු මිල වැඩි කරලා හරි අරුන්ට සුද්ධ වෙන්න මිනිහා වැඩේ දෙනවා."

ජනතා විමුක්ති පෙරමුණ ද කියන්නේ ඔය ටිකමය. කිසිම විසඳුමකට අකමැති ජවිපෙය යුද්ධයට කැමති නිසා මේ රජය ආරක්ෂා කරන බව කියයි. එසේ නොවුනහොත් පැය 24න් මේ රජය පෙරලා දමන බව කියන ජවිපෙය මීළඟට රටේ බලයට පත්විය යුත්තේ යූ ඇන් පීය නොව තමන් බව ප්‍රකාශ කරයි. එජාපයේ ක්‍රියාකාරකම් නිසාය. නමුත් මීළඟ මැතිවරණයකදී ශ්‍රී ලනිපය සමඟ හවුල් නොවී තනිවම ජවිපෙය තරඟ කළොත් පවතින ආසන ගණන 10, 12 කට බැස තවත් පිරිහෙන බව සෝමවංස අමරසිංහ හොඳින් දනී. ඒ නිසා මේ පැවැත්ම දිගටම

> ***රජය ආරක්ෂා කරන්නට කැපවී සිටින ජවිපෙයට රජයෙන් මාධ්‍යයට එල්ලවී ඇති ප්‍රහාරද අමතක කරන්නට සිදුවී ඇත.***

තබාගන්නට නම් මහින්ද සමග මේ යන ගමන කෝකටත් හොඳ බව දන්නා ඔහු මේ රජය ඊ ළඟ මැතිවරණය දක්වාම බලයේ තබා ගැනීමට තම දෑත් ඔසවයි. ඉඳහිට මොනවා හෝ දූෂණයකට, බලය බෙදීමකට උද්ගෝෂණය කරන ජේවීපිය ඒවා කරන්නේ ජනතා ආපවාදයෙන් ගැලවීමට විනා අවංක හැඟීමකින් නොවන බව තේරෙන්නේ ඉන්දු ලංකා ගිවිසුමට අනුව ජේ ආර් ගෙන ආ බලය බෙදීමේ යෝජනාවලටත් ඔවුන් අකමැති නිසාය. සියල්ලටම අකමැති වන ජේවීපිය දෙමළ ජනතාවට ලබා දෙන්නේ කුමක්ද යන්න තවමත් හරිහැටි ප්‍රකාශ කර නැත. එසේම ප්‍රභාකරන් හා දෙමළ ජනතාව යනු දෙපිරිසක් බව ඔවුන් හරි හැටි තේරුම් ගත් බවක් පෙනෙන්නටද නැත. ඒ නිසා රජය ආරක්ෂා කරන්නට කැපවී සිටින ජවිපෙයට රජයෙන් මාධ්‍යයට එල්ලවී ඇති ප්‍රහාරද අමතක කරන්නට සිදුවී ඇත. වෙනදාට පෞද්ගලික මාධ්‍ය සමඟ මඩ නාගත් රජය, දැන් මඩ ගාගන්නේ රජයේම මාධ්‍ය වලට එල්ල කරන තර්ජනත් සමඟය.

මර්වින් සිල්වා නැමැති පත්කල මන්ත්‍රී හා කම්කරු ඇමතිවරයා හරහා රජය මඩ ඇදගෙන නාගනියි. රූපවාහිනියට පැන තම හෙන්චයියන් සමඟ අසූචි තවරා ගත් ඇමතිවරයා දැන් පලිගැනීමට සූදානම් වන්නේ යුද්ධයට මුවාවෙමිනි. ඔහු තම ගැලවීමට යොදා ගන්නේද යුද්ධයයි. තමා දුටුගැමුණු බව කියා ගන්නා ඔහු මාධ්‍යවේදීන්ට හොරෙන් පහරදෙයි. මෑතකදී අතුරුගිරියේදී බරපතල තුවාල ලැබූ ලාල් හේමන්ත මාධ්‍යවේදියාට පහරදී ඇත්තේ මර්වින්ගේ හෝ ඔහුගේ පුතාගේ හෙන්චයියන් බව හොඳින් දැන දැනත් ඔහුට පැය 24න් දඬුවම් දී, රජයෙන් නෙරපා දමනු වෙනුවට අද රජය කරන්නේ ඔහුගේ පැවැත්ම තව තවත් තහවුරු කිරීමයි.

ළඟකදි මහින්ද ලස්සන කතාවක් කරලා තිබුණා. ''මර්වින් සිල්වගෙන් වැඩ ගත්ත අයට තමයි ඔහුව දැන් අස් කරන්න කියන්නෙත්." ඔහු ඒ ඇඟිල්ල දිගු කලේ චන්ද්‍රිකාටයි. ජනතාව මහින්දට බලය දුන්නේ චන්ද්‍රිකා කරන දේවල් කරන්නට නොවේ. චන්ද්‍රකාගේ හැමදේම අනික් පැත්ත පෙරලපු මහින්දට මර්වින්ව අනික් පැත්ත පෙරලන්න බැරි ඇයි. මහින්ද ඔහුගෙන් දැන් වැඩ ගන්න නිසාද? ඒ නිසා මහින්දත් මර්වින්ට ඇමතිකමක් දී ඇත්තේ වැඩගන්නට බව දැන් කාටත් තේරෙයි. මර්වින් ඒ වැඩේ නියමෙට කරගෙන යයි. මර්වින් නැමැති දුටුගැමුණු රජු හමුවේ අද විධායක මහින්දලා පවා ගල් බිල්ලන් බවට පත්ව ඇත්තේ ඒ නිසාය.

මේ සියලු කාරණා සලකා බලනකොට මහා පිංගුල ජාතකයෙන් අපිට වැදගත් උපදෙසක් ලබා දෙනවා. ඒ නිසා මේ පහත ඇති ඒ කතාවේ කොටස කියවලා බලන්න.

යටගිය දවස බරණැස් නුවර පිංගුල කියලා රජෙක් රජකම් කලා. මේ රජා දුෂ්ට, අසාධාරණ දරුණු රජෙක්. ඔහු ජනතාවට, අමාත්‍ය මණ්ඩලයට හරියට කුරිරුකම් කලා. ඒ නිසා ජනතාව හිටියෙ ඔහු ගැන වෛරයෙන්. බෝධිසත්වයෝ මේ පිංගුල රජුගේ පුත්ව ඉපදී වාසය කළා. කලකින් ජනතාවගේ වස් දොස් නිසා රජු මිය ගියා. බෝධිසත්වයෝ රජ වුණා. බෝධිසත්වයෝ රජු වීම ගැන ජනතාව ප්‍රීති වුණා. මේ ප්‍රීතිවෙන උත්සවය අතරෙ එක් දොරටු පාලකයෙක් අඬ අඬා වැලපෙන්නට වුනා. බෝධිසත්වයෝ ඔහු ළඟට කිට්ටු වී ඇයි අඬන්නේ කියා ඇසුවා. ''රජුනි මම අඬන්නේ උන්වහන්සේ මිය ගිය දුකට නොවේ" බයට. ඒ නපුරු රජු උඩු මහලට යන වේලෙත් බහින වේලෙත්, හැමතිස්සේම කුළු ගෙඩියක් වැනි තම අත් මිටින් මට ටොකු ඇන්නා. යට ලෝකයට ගිය උන්වහන්සේ යමයන්ටත් ටොකු ඇන්නොත්, යමයෝ ආපහු උන්වහන්සේව මෙහෙට එවාවි. එතකොට ආයිත් මට ටොකු කන්නට වේ යැයි බිය වෙලා  මම අඬන්නේ. ඔහු කියයි.

දොරටු පාලකය, මගේ පියා වෙනත් බවයක ඉපදුනොත් මිස පැරණි සිරුරෙන් ආපසු මෙහි එන්නේ නැහැ. ඒ නිසා බිය නොවී සතුටින් ඉන්න. බලයට පත් පුත් රජු කිව්වා. ඊටපස්සේ දොරටු පාලකයා සතුටින් ගී ගයමින් ප්‍රීති වුණා. ඉතින් මේ කතාවේ පිංගුල රජු නූතන මර්වින් ගැමුණු රජුට උපමාකරගෙන කියවලා බලන්න. ලේ එන්න ටොකු කාපු මර්වින් රජු දැන් හදන්නේ ටොකු ඇනල අනික් මිනිස්සු මරන්නයි. ඒ නිසා ඒ වගේ දුෂ්ඨයන් පන්නලා දාන එක මහින්දගේ යුතුකමක් මෙන්ම වගකීමක්. ජවිපෙයට එයින් කොටසක් හිමි වෙනවා. ඒ මේ රජය බලයට පත් කරන්නට ජවිපෙයද උදව් කල නිසා. ප්‍රභාකරන් වැනි දුෂ්ඨයන් විනාශ කරනවා වගේම මේ වගේ දුෂ්ඨයන් පන්නා දැමීමත් කාගේත් සතුටට මෙන්ම සැනසීමටද හේතුවක්.


VCE TUTORING

**Chemistry, Biology, Maths and English**

Secondary School Teacher fully qualified and experienced in teaching all year levels
Registered with the Victorian Institute of Teaching
Specializing in primary, secondary and VCE subjects
Students of all academic levels welcome

Individual classes or small groups

Discounts available for two or more family members and students taking more than one subject

Experienced in providing help for School Assessed Coursework (SACs)

Call
Sandya 9437 7801
Mobile: 0402 503 398



**ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා**

Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

**DENTIST**

**Facilities are also available for :**
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

**1254 Plenty Road, Bundoora 3083**
**Tel : 03 9467 7760**



**රුවින් දිළෙන්නට**



ඔබේ සොඳුරු මංගල දිනයේ
අපේ සම්ප්‍රදායික රටාවෙන් හා
නවීන විලාසිතාවෙන්
පිරිපුන් මනාලියක දක්වා හැඩ වීමට

මනාලියන්ගේ මල් කළඹ සැකසීම

ඔබේ සියලුම රූපලාවන්‍ය කටයුතු
එකම තැනකදී පහසු මිලකට

- කාන්තා කොණ්ඩා කැපීම හා කොණ්ඩා මෝස්තර
- පර්ම් කිරීම ස්ට්‍රේට් කිරීම කලර් කිරීම
- ටින්ට් කිරීම රීබොන්ඩිං කිරීම
- ෆේෂල් කිරීම වැක්ස් කිරීම
- ත්‍රෙඩින් කිරීම මුහුණ බ්ලීච් කිරීම සම බ්ලීච් කිරීම ඇතුලු සියලුම රූපලාවන්‍ය කටයුතු සඳහා

දස වසරක පළපුරුද්ද සමගින්
උසස් ඩිප්ලෝමාධාරිණී

**ප්‍රෂානි සුරවීර**
*Salon Colour Box*
*14 Winterton Close*
*Epping*
***TP 9401 3727 / 0425 805 754***